# මුතුකුමාරණ කවි මුතු

"ලෝකයෙහි පළමු මැ පද්‍ය බන්ධනය කළේ වාල්මිකී ඉසිවරයා බව කිවැවේ. මෙම පද්‍ය බන්ධනයට හේතු වී ඇත්තේ ප්‍රේමටයන් බැඳී සිටි කොස්වා ලිහිණියකගේ වියෝවලාපයයි. වාල්මිකී ඉසිවරයා තපස් රකිමින් සිටියදී අසලට පැමිණි කුරුළු වැද්දෙක් සමහන් සුව විඳි කුරුළු යුවලකගෙන් කුරුල්ලා විද මැරීලු. වලප්නා වූ ලිහිණියගේ ශෝකී හඬ ඇසීමෙන් සංවේගයට පත් වාල්මිකී රිසිවරයාගේ මුවින් අනුෂ්මුන් ඡන්දසට අයත් පහත සඳහන් පද්‍ය (ශ්ලෝකය) නිතැතින්ම පිට වී ඇත."




"මා නිෂා ද ප්‍රතිශ්ඨාං ත්වමගමඃ ශාශ්වතී සමාඃ යත් ක්‍රෞඤ්චමිථුනා දෙකම විධී කාව මොහි නම්"

"ලෝකයේ මුල්ම පද්‍ය මේ යැයි ද ශෝකයෙන් කියවුණු හෙයින් ශ්ලෝක නම් වී යැයි ද කියති. එහෙයින් වාල්මිකී ඉසිවරයා හට "කවි" යන නාමය ද පට බැඳුනි."

කවියේ ආරම්භය පිළිබඳව මෙලෙසින් ලියන්න් මව්බිමේ ප්‍රවීණ ගී පද නිබන්ධක සුනිල් සරත් පෙරේරා ශූරීන් ය. "කඳුළු මුසු වූ මගේ කවිය" නම් වූ සිරි විමල මුතුකුමාරණ කිවිඳුණන්ගේ කවි එකතුවට පෙරවදන් ලියනා සුනිලුන්, කිවිඳුණන් පිළිබඳව ලියූවකින් මුතුකුමාරණ කවි මුතු පිළිබඳ විමසුම ඇරඹුම වඩාත් සුදුසු සේ හැඟෙයි.

"සිරිවිමල කිවිසුරාණෝ තම කවි මගේ ශිථිල ගුණය සරළ සුමග බස් වහරින් හා රීතිය මගින් වඩාත් ඉස්මතු කිරීමට සමත් වේ. කුමරතුඟුවන් අනුදත් භාෂාත්මක ශුද්ධ රීතිය මෙහි බොහෝ කවි වල




දක්නට ලැබෙයි."

සුනිලුන් කවි එකතුව පිළිබඳව ලියන්නේ මෙලෙසයි; "කඳුළු මුසු වූ මගේ කවි" පබඳ කිවිසුරු සිරිවිමල මුතුකුමාරණයන්ගේ පද පබඳ බවට ලත් හද පබඳකි. මෙහි නිර්මිත බොහෝ කවිවලට පාදක වී ඇත්තේ පියකර බිරිඳගෙන් වියෝජිත හිමියෙකුගේ හදවත සියුම් ලෙස සසල කළ වියෝග කම්පනයයි."

ප්‍රිය බිරිඳගේ වියෝවය තුළින් කිවිඳුණන් තමන් අදහන බොදු සංකල්ප පිළිබඳව මෙනෙහි කිරීමටත් ඉන් සිත සනහාගන්නටත් උත්සාහ කරයි. "ඇය තුළින් වට අනාත්ම භාවය දුටුවෙමි." කවිපෙළෙහි කිහිපයකි මේ;

"අපමණ ව දුක් වී
බොහෝ කඳුළුද හෙළුවා
අපේ යටගිය දවස
කොහි ගියාදැයි සිතුණා"

"ඇය තුළ ඇය නොවුණි
සිතේ කිසිවක් නො ඇලුණි
යමක් හා නො ගැටුණි
දුකක් ඇය හ ට නොදැනුණි."

අවසන් කාලයේ වූ කල්පනාව අඩු බව පිළිබඳව මුතුකුමාරණයන් ලියූ ආකාරයයි ඒ. ශබ්ද රසය නැංවෙන සේ කවි පබැඳීම ශූර කවියෙකුගේ හැකියාව පෙන්වන ගුණයකි. "ඇය පිළිබඳව මගේ පැතුම" කවි පෙළෙහි එක් කවකි පහත දැක්වෙන්නේ;

විවා දිවියෙහි මිහිර කලතා පොවා අමතක නොවන විලසින පොවා සෙනෙහස දුවා" දරුවන් සදා දී සෙත ලොවට සලසන මවා පෑ බුදු හිමිගේ දහමෙයි පෙනෙන අනියත ගුණය දුක දෙන නවා තැන හැර ගියා වෙද ඔබ සදා සැනසුම නිවන සොයමින

කවියේ මුලත් අගත් එළිසමය රකිනා කිවිඳුණන් මුල් එළිසමය රැකීමට "වා" යන්නත් අග එළිසමය රැකීමට "න" යන්නත් යොදා ගනියි. මුල් එළිසමය රැකීමට " විවා", "පොවා", "මවා" හා "නවාතැන" යන වචන එන කවි යොදා ගැනීමට අමතරව "වා"යන්නෙන් ශබ්ද රසය කවිය මැදදී ද නැංවීමට ඔහු උනන්දු වෙයි. ඒ නැවතත් "පොවා" හා "දුවා" යන වචන යොදමිනි. ඊටම "ගියාවෙද" වචනය ද එක් වෙයි.

නිතර දැකීමට නොලැබෙන තමන්ගේ ම යෙදුම් යොදා ගැනීමට නිර්මාණකරුවෝ බෙහෙවින් උනන්දු වෙති.

"පිනෙන් දහමින් ඔබට සලකමි" එවැන්නකි.

"එක් වී නිවන් යාමට" යන්න කිවිඳනන් ලියන්-න් "එක්වි නිවී යාමට" ලෙසිනි.

"ජීවිතයෙහි අඩක් මගේ නැති වුණා හන්දා..."

මේ තවත් එවන් යෙදුමකි. බිරිඳ රෝගාතුරුව සිටිනා කාලයේදී ලියූවකි මේ ;

"පැහැබර දිවිය අප එකතුව දැක
ගත්ත
අද මට පෙනෙන්නේ නැත එය ගිය
පැත්ත
පෙර කල ඇසුනු ආදර-පෙම්බර
ඇත්ත
පෙරැළී තිබේ අද එහි කණපිට
පැත්ත"

මුතුකුමාරණනයන් මව් බිමේ සිටියදී ඔහුගේ එකම දියණිය ඔවුන්ගෙන් වෙන්ව විදේශගත වීම ඔහුව සංවේදී කරවූවක් විය.

කැදැල්ලෙ ඇති කළ කුරුළු පොඩිත්ති
දුර රටකට අද ඉගිල්ලිලා
කැදැල්ල පාළුයි - කැදැල්ල පාළුයි
මුළු පරිසරයම නිහඬ වෙලා

කුරුළු අම්මටයි කුරුළු පියාටයි
කිරිල්ලී නැති වුණා දුක දැනිලා
ඈත බලාගෙන - මෑත බලාගෙන
තටු හකුලාගෙන නිහඬ වෙලා.

ඉහත කවි වල "කැදැල්ල පාළුයි" හා "ඈත බලාගෙන" යන පද දෙවර බැගින් ලිවීමෙන් කවිත්වය ඉක්මවා ඊට ගීතවත් බවක් නවරත්නට ද කිවිඳුණන් හපන් වෙයි.

ගුණ වැනුම්, පරිසර වැනුම්, සෞන්දර්යාත්මක දේ කවියෙකුට නො හුරු දේ නොවේ. එහෙත් තම මිතුරු මිතුරියන් සමග කවියෙන් ලිපි හුවමාරු කර ගැනීම නිතර දක්නට නොලැබෙන්නකි. තමන් ලියන දේට කවියෙන් පිළිවදන් දීමට හැකියාව ඇති මිතුරන් හෝ මිතුරියන් සිටීනම් එය කවියෙකුට මහත් රුකුලකි. තමන්ට ලැබෙන කවි ලිපි කවියෙකුට උත්ප්‍රේරකයන් ම වන්නේ ය. 1956 දී පමණ සිරිවිමල මුතුකුමාරණ කිවිඳුණන් තිස්සමහ-ාරාමයේ සේවය කළ සමයේ හඳුනාගත් ආනන්ද සමරකෝන් (ජාතික ගීයේ නිර්මාතෘ නොවේ) නම් වූ රසවතා එවන් අදහස් හුවමාරුවකට මුල පිරූයේ කවියෙකි.

ඔබ එවූ කවි ලිපිය මා සොයමින් ආවා
එසු ගිය කලක තතු යළි පැහැදිලි වූවා
වැනසෙන මිනිස් ගුණදම් හොඳ හැටි පෑවා
අපගේ මිතුරු දම තව කල් පවතීවා !

මෙහිදී ආනන්ද සමරකෝන් මිතුරා තමන්ට ලියූ කවි පෙළ කීපයක් ද "කඳුළු මුසු වූ මගේ කවියෙ" හි ඇතුළත් කිරීමට කෘතවේදී විය මුතුකුමාරණ කිවිඳුණන් තද බල ලෙස රෝගීව සිටි කලක ඔහු ලියූ කවියකි මේ.

මගෙ ජීවිතයෙ අවසන් අදියර පෙන්නා
ලේ ධාවනය වෙයි මිනුමත් බිය ගන්නා
පෙනහලු සිදුරු තුන එක් වී දඟලන්නා
දැන් ජීවිතයෙ හැටි අටවෙනි ඉර පැන්නා

ඕස්ට්‍රේලියාවට පදිංචියට ඒමට පළමුව සිය මිතුරා වෙත මුතුකුමාරණ කිවිඳුණන් ලියූ කවි පෙළකින්ය මේ කවිය තෝරාගනු ලැබූයේ

ඇල්මෙන් ගැටීමෙන් ටික ටික දුරුවෙන්න
මල්මෙන් පෙනෙන අනිසය වටහා ගන්න
සිල් ගත්තේ නැතත් සිත සනසා ගන්න
කල් යල් පැමිණ ඇත හැම දේ හැර යන්න

මේ ලියවී ඇත්තේ සදාකාලික සත්‍යයක් වුවද සිරිවිමල මුතුකුමාරණ කිවිඳුණන්ට නිරෝගී සුවයත්, දීර්ඝායුත් තව තව කවි පබැඳීමේ වාසනාවත් ලැබේවා ! ය යන්න අපගේ ප්‍රාර්ථනයයි.




**තිසර - සුන්දර මිනිසුන්ගේ සයිබර් අවකාශය**
www.thisara.com

